# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.04.12 පැය 0805 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 597/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

**பொலிஸ் ஊ**

**டகப் பிரிவுக்கு கிடைத்த முக்கிய தகவல்கள்**

**01. දක්ෂිණ අධිවේගී මාර්ගයේ ලොරි රථ දෙකක් ගැටී පුද්ගලයන් දෙදෙනෙකු ජීවිතක්ෂයට - ඇල්පිටිය පොලිස් වසම.**

2026.04.11 දින රාත්‍රී ඇල්පිටිය පොලිස් වසමේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාර්ගයේ කිලෝමීටර් 54.9 කණුව ආසන්නයේදී කොට්ටාව දෙසට ධාවනය වූ ලොරි රථයක් එම දිශාවටම ඉදිරියෙන් ධාවනය වූ සිමෙන්ති පටවන ලද ලොරි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පසුපසින් ගමන්කළ ලොරි රථයේ රියැදුරු සහ එහි ගමන්ගත් පුද්ගලයින් දෙදෙනෙකු බරපතල තුවාල ලබා නාගොඩ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු පුද්ගලයින් දෙදෙනෙකු මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 62 හා 64 වයස්වල පසුවූ තිස්සමහාරාම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අධිවේගී මාර්ග අනුපාලක ස්ථානය සහ ඇල්පිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**தெற்குக் விரைவுச் வீதியில் இரண்டு லாரிகள் மோதல் – 2 பேர் உயிரிழப்பு (எல்பிட்டிய பொலிஸ் பிரிவு)**

2026.04.11 இரவு எல்பிட்டிய பொலிஸ் பிரிவில் தெற்கு அதிவேக வீதியில் 54.9 கி.மீ. கல் அருகில் கொட்டாவை நோக்கி சென்ற ஒரு லாரி, அதே திசையில் முன்னால் சென்ற சிமெந்து ஏற்றிய மற்றொரு லாரியுடன் மோதியுள்ளது.

இவ் விபத்தில் பின்னால் சென்ற லாரியின் ஓட்டுநரும் அதில் பயணித்த இருவர் பலத்த காயமடைந்து நாகொட மருத்துவமனையில் அனுமதிக்கப்பட்ட பின்னர் இருவர் உயிரிழந்துள்ளனர்.

மரணமானவர்கள் 62 மற்றும் 64 வயதுடைய திஸ்ஸமஹாராம பகுதியைச் சேர்ந்தவர்கள்.

லாரி ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். மேலதிக விசாரணைகள் அதிவேக வீதி கட்டுப்பாட்டு நிலையத்துடன் இணைந்து எல்பிட்டிய பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.

**02. යතුරු පැදියක් බස් රථයක ගැටී යතුරුපැදිකරු හා පසුපැදිකරු ජීවිතක්ෂයට - වැලිකන්ද පොලිස් වසම.**

2026.04.11 දින රාත්‍රී වැලිකන්ද පොලිස් වසමේ මරදන්කඩවල තිරුක්කොන්ඩියාමඩු මාර්ගයේ කිලෝමීටර් 92 කණුව ආසන්නයේදී මඩකලපුව දෙසට අපරික්ෂාකාරි ලෙස ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් ධාවනය වූ පුද්ගලික බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු තුවාල ලබා වැලිකන්ද රෝහලට ඇතුළත් කිරීමෙන් පසු තුවාලකරුවන් දෙදෙනා මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 31 හා 55 වයස්වල පසුවූ වැලිකන්ද සහ රත්තොට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අනතුරට සම්බන්ධ බස් රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැලිකන්ද පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**மோட்டார் சைக்கிள்-பஸ் மோதல்; 2 பேர் உயிரிழப்பு (வெலிகந்த பொலிஸ் பிரிவு)**

2026.04.11 இரவு வெலிகந்த பொலிஸ் பிரிவில் மடதன்கடவல-திருக்கோண்டியாமடு வீதியின் 92 கி.மீ. கல் அருகில், மட்டகளப்பு நோக்கி அவதானமின்றி சென்ற மோட்டார் சைக்கிள், எதிர்திசையில் வந்த தனியார் பேருந்துடன் மோதியுள்ளது.

இவ் விபத்தில் மோட்டார் சைக்கிள் ஓட்டுநரும் பின்னால் பயணித்தவரும் காயமடைந்து மருத்துவமனையில் அனுமதிக்கப்பட்ட பின்னர் இருவரும் உயிரிழந்துள்ளனர்.

உயிரிழந்தவர்கள் 31 மற்றும் 55 வயதுடைய வெலிகந்த மற்றும் இரத்தோட்ட பகுதியைச் சேர்ந்தவர்கள்.

பேருந்து ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். மேலதிக விசாரணைகள் நடைபெற்று வருகின்றன.

**03. යතුරු පැදියක් ත්‍රී රෝද රථයක ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - මොරවැව පොලිස් වසම.**

2026.04.11 දින සවස මොරවැව පොලිස් වසමේ මොරවැව නාමල්වත්ත මාර්ගයේ නාමල්වත්ත හන්දිය ආසන්නයේදී මොරවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් ධාවනය වූ ත්‍රී රෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකාරිය තුවාල ලබා ත්‍රිකුණාමලය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ මොරවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ ත්‍රීරෝද රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මොරවැව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.

**மோட்டார் சைக்கிள்-முச்சக்கர வாகன மோதல்; ஓட்டுநர் உயிரிழப்பு (மொரவெவ பொலிஸ் பிரிவு)**

2026.04.11 பிற்பகல் மொரவெவ பொலிஸ் பிரிவில் நாமல்வத்த சந்தி அருகே, மொரவெவ நோக்கி சென்ற மோட்டார் சைக்கிள், எதிர்திசையில் வந்த முச்சக்கர வண்டியுடன் மோதியுள்ளது.

இவ் விபத்தில் மோட்டார் சைக்கிள் ஓட்டுநரும் பின்னால் பயணித்த பெண்ணும் காயமடைந்து திருகோணமலை மருத்துவமனையில் அனுமதிக்கப்பட்டனர். பின்னர் ஓட்டுநர் உயிரிழந்துள்ளார்.

உயிரிழந்தவர் 52 வயதுடைய மொரவெவ பகுதியைச் சேர்ந்தவர்.

முச்சக்கர வண்டி ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். மேலதிக விசாரணைகள் மொரவெவ பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.

**பொலிஸ் ஊடகப் பிரிவு**